# විමලජෝති හිමියන්ට ආයුබෝවන් !



විමලජෝති හිමියන් උත්සව සභාව වෙත පෙරහරින් කැඳවාගෙන එති.



Photograph - Tissa Madawela තිස්ස මඩවල

## විමලජෝති හිමියෝ සිය රටට වඩිති !

ලන්ඩන් බෞද්ධ විහාරයේ නේවාසිකව වෙසෙමින්, එක්සත් රාජධානියේ ධර්මදූත කටයුතු වල නිරත වෙමින් අතිමහත් ශාසනික සේවාවක් වසර **14** ක් පුරා ඉටු කළ රාජකීය පණ්ඩිත පූජ්‍ය විල්ඔයේ විමලජෝති ස්වාමීන් වහන්සේ ගිය සතියේ **6** වෙනි දින ශ්‍රීලංකාවට වැඩම කළහ. මොනරාගල ඔක්කම්පිටියේ ගල්ටැම්මණ්ඩිය පුරාණ විහාරස්ථානය දැන් උන්වහන්සේගේ ස්ථිරව වෙසෙන විහාරයයි.

සුපේශල, මෘදු හිතැති, සෞම්‍ය කතාබහෙන් යුතු යතිවරයාණ කෙනෙක් ලෙස එක්සත් රාජධානියේ බැතිමත්හු විමලජෝති හිමියන් හඳුනාගෙන සිටිති.

උන්වහන්සේ ගේ දහම් දැනුම හා පාලි සංස්කෘත දැනුම විශිෂ්ඨය. වසර බොහෝ ගණනාවක් උන් වහන්සේ නොකඩවා මාසිකව **ලංකාවිත්ති** පුවත්පත තුළින් **හිතෝපදේශ** යන මැයෙන් අවවාද අනුශාසනාත්මක දහම් පණිවුඩයක් පාඨකයින්ට බෙදා දුන්හ. එය කියවූ සියළුම දෙනා පාහේ ඒ අනුශාසනා හිස් මුදුනින් පිළිගත් අතර ඒ කරුණු බොහෝ සේ තම ජීවිත සරු කරන්නට ද, යහමගට යොමු කරන්නට ද ඉවහල් වන බව නොපැකිළ කියනු අප අසා ඇත.

විමලජෝති හිමියන්ට ගෞරවාචාර දැක්වීම් වස් උත්සවයක් ගිය මස ලන්ඩන් බෞද්ධ විහාරයේදී එහි විහාරාධිපති පූජ්‍ය බෝගොඩ සීලවිමල නාහිමි ප්‍රමුඛ අනෙක් සංඝයා වහන්සේලා විසින් සූදානම්කරනු ලැබ තිබිණ. ලන්ඩන් විහාරයට පැමිණෙන බැතිමතුන්ට විමලජෝති හිමියන් හා කතාබහ කරන්නට ද, උන්වහන්සේ වෙත තම ප්‍රණාමය දක්වන්නට ද ඉන් අවස්ථාව සැලසිණ. එම උපහාර උත්සවයට විශාල පිරිසක් සහභාගි වූ අතර ඒ බොහෝ දෙනාගේ පිළිගැනීම වූයේ උන්වහන්සේ ලංකාවට වැඩමකිරීම ලන්ඩනයට පාඩුවක් බවයි.

පූජ්‍ය විමලජෝති ස්වාමීන් වහන්සේට නිදුක් නිරෝගී සුවසෙත චිර ජීවනය ප්‍රාර්ථනා කරමු!

**වෙනුර**

## පත්තරයටයි! ඔබටයි! ඔබේ පෑනටයි!

ලන් ඩන් වලින් මෙහි ආ පණිවිඩ යක් ය
ලන් කා විත්තියට පසළොස් වස රක් ය
පින් බර පුතෙකුගේ ජාතික මෙහෙ යක් ය
සිං හල අපට ලොකු ආඩම්බර යක් ය

ඩිං ගක් ඉංගිරිසි දෙතොලෙහි ගැටුණු විට
සිං හල මතක නැතිවන අය සිටින රට
ලං කාව යයි කීවොත් දෑ හැඟුම පිට
පිං මඳ දූ පුතුන් එරෙහිව එයිද මට?

ය ට වී අවර දිග බසකට - දනය කට
ර ට ගැන නොහිතුවොත් මව්ගුණ මෙනෙහි කොට
පි ට රැටියනට අගයක් ඇති සියළු විට
හෙට මොන රටක් වේවිද මේ සිහල රට

නෙක නෙක ගැටළු මැද අතමිට නැතිව රිදී
මොක කට මොන රටක හිටියත් පිටත ඇදී
එ ක පවුලක පිරිස මෙන් අපි එකට බැඳී
රැ ක ගමු අපේ රට වෙන කිසිවෙකුට නොදී

මෙම හැඟු මෙන් යුතුව ලංකා පුතෙකු අපේ
පි ය නැගූ මගේ පහළොස් වස කුමුදු පිපේ
තු ටු ගඟු ලක ගිලී ලැබ, දැක අමිල සැපේ
ජ ය ම ගු ලකින් පෙන්වයි ලක්මවගෙ ඔපේ

පැට ලී සියළු තතු ගැදි පැදි රසේ පිරී
පි ට වෙන පුවත් පත ඇති ලක් බිමේ සිරී
ය ට කොට සිය දනය ඔහු ඇති හිතේ දිරී
ර ට රටවල් වලට නොමිළේ බෙදා හරී

ල ං කා විත්ති සාඩම්බර පුවත් පත
පෙන් වා ජාති ආලය මව් බිමක් වෙත
සි ං හල හඬින් මෙපමණ දුර ඇවිත් ඇත
ඉ න් සැලසුනා ජාතියටත් මහත් සෙත

කිසි වෙකු ළඟ නැතිව වෙහෙසී දිවා රැයේ
නිසි ලෙස හැම අතින් තොරතුරු සොයා දැයේ
මැසි විලි නොකියමින් ලොවටම බෙදා තියේ
වි සි රෙයි සුබා සිරි මල් ජය තටා කයේ

ම න බැඳි දයාබර හිතකින් ආනන් ද
ර ණ සිංහයන් ගුණ කියවෙන නාමෙන් ද
ප ණ දී රට දැයට ලැදි සිය පෑනෙන් ද
ගෙන යයි කතුකමේ වැඩ නොලබා නින් ද

ප ත් තරයටයි ඔබටයි ඔබේ පෑනට යි
මි ත් තරකමින් සැරදේ! කියා කීමට යි
සි ත් බැඳ මෙවන් කැප වීමටයි සේවෙට යි
සෙත් සිරි පතයි කවි ලෝකයයි මේ රට යි !

♦ **කිවිපති- පාතකඩ කුලතිලක**
මහරගම Sri Lanka

## හිතවතෙකුට සුබපතනු සඳහා!

මගේ සමීප හිතවතෙකු වන දයා ආනන්ද ලංකාවෙන් පිටව ගිහිං වසර තිහකට වැඩි කාලයක්. ඔහු මගේ හිතවතෙකු වුනේ 1965 දී පමණ. දයා ගමේ ඉපදුණු, හැදුණු, වැඩුණු කෙනෙක්. ඒ නිසා ද කොහෙද සිංහල බසට, දැයට හා හැදියාවට ඔහු තුළ ඇති ඇල්ම අප්‍රමාණයි.

ඔහු හොඳ රසවතෙක්. හොඳ කලාකරුවෙක්. විචක්ෂණ බුද්ධියක් ඇති කෙනෙක්. ක්ෂණික උපහාසයට, හාස්‍යයට දක්ෂකමක් හා නැඹුරුවක් ඔහු තුළ තිබෙනවා. ඒ සියල්ලටම වඩා ඔහු අතිශය කාරුණික මිනිසෙක්. දක්ෂතා බොහොමයි. පුවත් පත, සිනමාව, කවිය, ගීතය, එමෙන්ම ගායනය ආදී ක්ෂෙත්‍ර ගණනාවක්. හොඳට පෑන හුරුයි. ඔහු එංගලන්තයේ සිංහල පත්‍රයක් පටන්ගත් බව අසා එදා මම කීවෙ එම කාර්යයට හොඳම තැනැත්තා ඔහු ම බවයි. වසර පහළොවකුත් ගෙවුණා. ඒ මම කී දේ හරි.

වසර කීපයකට වරක් තම මව්බිමට ඇවිත් යන්න එන ඔහු කාලය සමග හැඩරුවින් වෙනස් වී ඇතත් ගතිගුණ වලින් සහ හිතෛෂී බවින් බිඳකුදු වෙනස් වී නැහැ. ඔහු ඒ දයා ආනන්ද රණසිංහමයි. සිය හැකියාව උපරිම ලෙස මල්ඵල ගැන්වී එහි පහළොස් වසරේ ජයග්‍රහණය සමරණ මේ අවස්ථාවේ අපේ උණුසුම් ශුභ ප්‍රාර්ථනා දයා ආනන්ද නම් ඒ හිතවතාටයි !

♦ **සිරි කහවල**
*උපදේශක*
*ටවර්හෝල් රඟහල පදනම*
**කොළඹ 7**

## ලංකා විත්තියට සුබ පැතුම් ! සුබ පැතුම් ! සුබ පැතුම් !

### හෘදයාංගම සුභාශිංසන !

විදේශයක පදිංචිව සිටින විට දැනෙන්නා වූ හුදකලාව තරමක් දුරට හෝ තුරන්කර, හදට මිහිරක් ගෙන දීමට හෙළ බසින් රචිත වූ එම රමණීය ලංකා විත්ති බෙහෙවින් උපකාරී වූ වග අපි දනිමු. දේශානුරාගී ලිපි වැල් රාශියකින් ද, රාජ්‍ය උපදේශකයිනුත් දෙවැනි කරවන උපැහැරණයන්ගෙන්ද, ලොව පුරා විසිරී සිටින ශ්‍රී ලාංකිකයින්ගේ රසවත් කවි පංතීන් ඇතුළු කවදටත් පැරණි නොවන හරබර ලිපි රාශියකින්ද සමුපේත ඒ **ලංකා විත්ති** මාසික සංග්‍රහය ලොව වෙසෙන සියළුම ශ්‍රී ලාංකිකයින් විසින් කියැවිය යුතු අගනා පුවත් පතකි.

කර්තෘ දයා ආනන්ද රණසිංහ මහතා ඇතුළු එම දක්ෂ සංස්කාරක මඬුල්ල වසර පහළොවක් තිස්සේ පවත්වාගන ගියා වූ එම කර්තව්‍ය සුළු පටු සේවයක් නොවන්නේය. එසේම විදේශයක පදිංචිව මෙවන් මනරම් ලිපි ගොනුවක් නොකඩවා මාසිකව ප්‍රකාශනය කර නොමිලයේ බෙදා හැරීම එසේ මෙසේ කාරියක් ද නොවන්නේ ය.

දිගින් දිගටම ලංකා විත්ති ශ්‍රී ලාංකිකයින් අතට පත්කිරීමට එම සංස්කාරක මණ්ඩලයට ධෛර්යය හා ශක්තිය වැඩිවැඩියෙන් ලැබේවායි අපි ප්‍රාර්ථනය කරමු. ලංකා විත්ති පුවත් පතට පහළොස්වස් සපිරෙන මෙම අවස්ථාවේදී එයට සුභ පැතුම් පණිවුඩයකින් සංග්‍රහ කිරීමට ලැබීම අප ලද භාග්‍යයක් කොට සලකමු.

♦ **සිරි හේරත්** Siri Herath
Editor - Tokyo Puwath
Tokyo - Japan

### මව්බිමේ සිට සුබ පැතුම්!

අප ලංකාවේ සිටියදීත්, ඉදහිට ලංකාවට ආ විටදීත්, රණේ යයි ආදරයෙන් අමතන දයා ආනන්ද රණසිංහ නම් අපේ පැරණි පත්තර මිතුරා මගේ පමණක් නොව මගේ සොහොයුරන් වන සුනිල් මාධව හා සඳුන් ඇතුළු අප පවුලේම දැඩි හිතවතෙකු වීය. අදත් එසේ ම ය. ඔහු එංගලන්තයේ සිට අප සංස්කරණය කරන ක්‍රීඩා පුවත් පතට බොහෝ කලක් වටිනා ලිපි හා විශේෂාංග ලීවේය. ඒ අතර ක්‍රිකට් ලෝකයේ සිද්ධීන් ගැන ලියූ ලිපි විශේෂය. රණේ කලක් ලේක් හවුස් ආයතනයේ ලන්ඩනයේ විශේෂ නියෝජිතයාද විය.

ඔහු සිංහළ පුවත්පතක් එංගලන්තයේ පළකරන බව මුල් වරට ඇසූ එකල ඒ ගැන මා පුදුම නොවූයේ ඔහු තුළ පුවත්පත් කලාව පිළිබඳ වූ දැඩි උනන්දුව හා හැකියාව දන්නා නිසා ය. අද, එදා ඔහු ඇරඹූ එම පුවත්පත වන **ලංකාවිත්ති** මුද්‍රණයට පත්ව, එළිදැක එහි **පහළොස්වන වසර** සමරයි. ඒ ගැන ද මා පුදුම නොවන්නේ රණේට එය පවත්වා ගෙන යා හැකි බව මා දැන සිටි නිසාය. සැතපුම් හත්දහසක් ඈත සිට වුවද අද මා ඔහුටත්, ඔහුගේ මා හැඟි පුවත්පත **ලංකාවිත්තියටත්** සුබාශිංසනය කරන්නේ හද පිරි සතුටෙන් සහ අපේ ඒ අඛණ්ඩ හිතවත්කම් ද මෙ වෙලෙහි මෙනෙහි කරමිනි.

♦ **සරත් ප්‍රේමතිලක**
Editor - ක්‍රීඩා Kreeda
ලේක්හවුස් - කොළඹ


ලංකා විත්ති පහළොස් වන සංවත්සරයට අපේ උණුසුම් සුබපැතුම්!

S

ශ්‍රී Lankan Restaurant
SEKERA සේකර
3 Lower Grosvenor Place,
London SW1W 0EJ
020 7834 0722
e-mail: info@sekera.co.uk
Web: www.sekera.co.uk